**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2023 ජලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 25ක් සඳහා අනිවාර්ය ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි සකස් කර තිබුණි. කෙසේ වෙතත්, ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකට පමණක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වූ අතර බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි.

සපයා තිබූ පිළිතුරු වලින් පහත සඳහන් පොදු දුර්වලතා සහ අත්වැරදීම් නිරීක්ෂණය කරන ලදී:

1.1 ගිණුම්කරණයේ මූලික සංකල්ප මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් අදාළ සංකල්පය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.

1.2 මෙම ප්‍රශ්නය මගින් පිරිවැය ගිණුම්කරණය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර සමහර අයදුම්කරුවන්ට ප්‍රශ්නයට වෙන් කරන ලද ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි විය.

1.3 තොගවල ශුද්ධ උපලබ්ධි අගය මත පදනම්ව තොගයේ වටිනාකම ගණනය කිරීම අපේක්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. කෙසේ වෙතත්, බොහොමයක් අයදුම්කරුවන් පිරිසකට ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීම පිළිබඳව දැනුමක් නොතිබුණි.

1.4 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 : වාර්තාකරණ කාලයෙන් පසු සිදුවීම් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර ලබා දීමට අපොහොසත් වී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි අන්තර්ගතය පිළිබඳව ඔවුන්ට පැහැදිලි අවබෝධයක් නොතිබුණි.

1.5 හවුල් ව්‍යාපාර පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර බොහොමයක් අයදුම්කරුවන් පිරිසක් සතුටුදායක පිළිතුරු ලබා දී ඇත.

1.6 ව්‍යාපාරය විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු අගය ගණනය කිරීම අවශ්‍ය වූ අතර බොහොමයක් අයදුම්කරුවන් පිරිසක් එය නිවැරදිව ගණනය කර තිබුණි. කෙසේ වෙතත්, සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් නිවැරදි පිළිතුර ලබා දීමට අපොහොසත් වී ඇත.

1.7 පිරිවැය ගිණුම්කරණයේ අරමුණු තුනක් (03) සඳහන් කිරීම අවශ්‍ය වූ අතර බහුතරයක් අයදුම්කරුවන් එම අරමුණු නිවැරදිව හඳුනාගෙන තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් කිහිප දෙනෙකුට පිරිවැය ගිණුම්කරණය ගැන අවබෝධයක් නොතිබුණි.

1.8 සංකලිත ගිණුම්කරණ පද්ධතිය සහ අසංකලිත ගිණුම්කරණ පද්ධතිය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. සංකලිත හා අසංකලිත ගිණුම්කරණ පද්ධති පිළිබඳ තිබූ මඳ දැනුම හේතුවෙන් බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අසමත් වී ඇත. මෙම ක්‍රම දෙක අතර ඇති වෙනස නිවැරදිව හඳුනාගෙන තිබුණේ ඉතා සුළු පිරිසක් පමණි.

**1.9** ලබා දී ඇති තොරතුරු මත පදනම්ව A නිෂ්පාදිතය සඳහා වසරකට ඇණවුම් කළ යුතු ප්‍රශස්ත ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීම අපේක්ෂා කළ අතර සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයේ ලබා දී තිබූ දත්ත අදාල ගණනය කිරීමට ආදේශ කිරීමට අපොහොසත් වූහ. ගණනය කිරීම සඳහා නිවැරදි තොරතුරු හඳුනාගෙන ඇත්තේ අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණකි.

**1.10** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වැනි වගන්තිය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු ලබා දී ඇති නමුත් සමහර අයදුම්කරුවන් ව්‍යාපාර කළමනාකරණය කරන්නේ කෙසේද සහ ව්‍යාපාරයට ප්‍රාග්ධනය යෙදවීම පිළිබඳව පිළිතුරු සැපයීමට අපොහොසත් වූහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

නිසි ලෙස ගිණුම් වාර්තා පවත්වාගෙන නොගිය ව්‍යාපාරික ආයතනයක ප්‍රාග්ධන ශේෂය සහ ශුද්ධ ලාභය ගණනය කිරීම අවශ්‍ය විය. සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධන ශේෂය නිවැරදිව ගණනය කර නොතිබුණි. තවත් සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය විය. සමහර අයදුම්කරුවන් ගිණුම්වල කලින් කළ ගෙවීම්/පෙර ගෙවීම් සහ උපචිත වියදම් ගලපා නොතිබුණි. සමහර අයදුම්කරුවන් ලබා දී ඇති තොරතුරු මත පදනම්ව ශුද්ධ ලාභය ගණනය කිරීමට අපොහොසක් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් ලාභ නොලබන ආයතනයක ආදායම් සහ වියදම් ගිණුම සහ සාමාජික ගාස්තු ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී.

නිරීක්ෂණය කරන ලද දුර්වලතා පහත පරිදි වේ:

- සමහර අයදුම්කරුවන් විසින් සාමාජික ගාස්තු ගිණුම නිවැරදිව පිළියෙළ කර නොතිබුණි. තවද, එම ගිණුමට අදාළ හර සහ බැර සටහන් නිසි ලෙස සටහන් කර නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් සාමාජික ගාස්තු ගිණුම සකස් කිරීමට උත්සාහ කර නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් විසින් 2022 ජූනි 01 වැනි දින මිලදී ගත් පිහිනුම් තටාක උපකරණ සඳහා ක්ෂයවීම් නිසි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින් හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර ඇත. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම් පිළයෙල කිරීමට අවශ්‍ය විය. හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය. ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම් වල ඇතුළත් කරන සටහන් පිළිබඳව අයදුම්කරුවන්ට පැහැදිලි අවබෝධයක් නොතිබුණි. එබැවින් බොහොමයක් අයදුම්කරුවන් ගැලපීම් එකිනෙකට මාරු කර සටහන් කර තිබුණි.

පහත දැක්වෙන පොදු දුර්වලතා නිරීක්ෂණය විය:

(1) සමහර අයදුම්කරුවන් කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම්වල සටහන් කරනවා වෙනුවට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වල සටහන් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය මත පොළිය සහ වැටුප් ප්‍රාග්ධන ගිණුම්වල සටහන් කර තිබුණි.

(3) බොහෝ අයදුම්කරුවන් **මාලකගේ** ණය පොලීය ගැලපීමට පෙර ශුද්ධ ලාභය හඳුනා ගැනීමට අපොහොසත් වීම නිසා ශුද්ධ ලාභය නිවැරදිව ගණනය කිරීමට අසමත් වූහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

**(A)** මෙම ප්‍රශ්නය මගින් අසංකලිත ගිණුම්කරණ පද්ධතියක් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් ලාභ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

පහත දැක්වෙන පොදු දුර්වලතා නිරීක්ෂණය කරන ලදී:

(1) සමහර අයදුම්කරුවන් අසංකලිත ගිණුම්කරණයට අදාළව පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස හඳුනාගෙන නොතිබුණි.

(2) අයදුම්කරුවන් ආරම්භක සහ අවසන් තොග ශේෂයන් වැරදි ලෙස මූල්‍ය සහ පාලන ගිණුම්වල ගලපා තිබුණි

(3) බොහොමයක් අයදුම්කරුවන් මූල්‍ය සහ පිරිවැය ගිණුම්වල විවිධ අයිතමවලට අදාල එක් එක් ගැලපුම් නිවැරදිව හඳුනා ගැනීමට අසමත් විය.

**(B)** බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් බරිත සාමාන්‍ය ක්‍රමය යටතේ නිකුත් කරන ලද තොගයේ වටිනාකම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස තොග ලෙජරයේ ශේෂය වැරදි අගයක් පෙන්විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

(A) ලබා දී ඇති තොරතුරු මත පදනම්ව යම් නිෂ්පාදිතයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ), යළි ඇණවුම් මට්ටම සහ අවම තොග මට්ටම ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි සූත්‍රය නොදැන සිටීම නිසා පිළිතුරු ලබාදීමට අපොහොසත් විය. එසේම, බොහොමයක් අයදුම්කරුවන් ආර්ථික ඇණවුම් ප්‍රමාණය නිවැරදිව ගණනය කිරීමට අසමත් වූහ. කෙසේ වෙතත්, අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් නිවැරදි පිළිතුර සඳහන් කර තිබුණි.

(B) මෙම ප්‍රශ්නය මගින් කාර්යයක් සඳහා අය කළ යුතු මිල ගණනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලබා දී ඇත. අයදුම්කරුවන් අතලොස්සක් පමණක් නිවැරදිව ලාභය ගණනය කිරීමට සමත් වූ අතර ගණිත දෝෂ හේතුවෙන් සම්පූර්ණ ලකුණු අහිමි කර ගෙන ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## C කොටස

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය සීමාසහිත පුද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පරීක්ෂා කිරීම සඳහා වූ අතර **(a)** සහ **(b)** ලෙස කොටස් 2 කින් සමන්විත වේ. **(a) කොටසින්** ලාභ'ලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය සැකසීම පරීක්ෂා කිරීම සහ **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලදී. පුද්ගලික සීමාසහිත සමාගමක කළමනාකාරිත්වයේ භාවිතය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීම අපේක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට උත්සාහ කර ඇති නමුත් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී ඇත.

පහත දුර්වලතා නිරීක්ෂණය විය:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළයෙල කිරීම:**

(1) බොහෝ අයදුම්කරුවන් කොටස් වලට අදාල හිමිකම් නිකුතුව සම්බන්ධයෙන් නිවැරදි ලෙස ගැලපීම් සිදු කර නොතිබුණි.

(2) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ආදායම් බදු ගැලපීම් ඔවුන්ගේ පෙරවැඩ වල පෙන්වා නොතිබූ අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අදාළ වර්ෂය සඳහා නිවැරදි ආදායම් බදු මුදල ගණනය කර නොතිබුණි.

(3) බොහොමයක් අයදුම්කරුවන් පිරිසක් බැංකු ණය පොලිය නිවැරදිව ගණනය කර නොමැත.

(4) බොහොමයක් අයදුම්කරුවන් ආදායම් ප්‍රකාශනයේ රුපියල් 628,000/-ක බොල්ණය සඳහා ප්‍රතිපාදන සටහන් කර ඇති නමුත් , මෙය නිවැරදිව ගණනය කර නොමැත.

(5) උපචිත සහ පෙර-ගෙවීම් ලෙජරයේ අදාළ වියදම් ගිණුම්වලට සකස් කර නොතිබුණි.

(6) සමහර අයදුම්කරුවන් ආදායම් ප්‍රකාශනයේ වැරදි අගයන් සඳහන් කර ඇති විට ඒ සඳහා අදාල පෙරවැඩ සටහන් අමුණා නොමැති හෙයින් ඒ සඳහා ලකුණු ප්‍රදානය කිරීමට අපහසු විය.

(7) බොහෝ අයදුම්කරුවන් ක්ෂයවීම් නිවැරදිව ගණනය කර නොමැත.

(8) සමහර අයදුම්කරුවන් පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම් සඳහා පෙරවැඩ සවිස්තරාත්මකව පෙන්වා නොමැති බැවින් ඔවුන් ලකුණු ලබා ගැනීමට අපොහොසත් වූහ.

(9) සමහර අයදුම්කරුවන් සමහර සංඛ්‍යා දහස් ගණනින් පෙන්වා ඇති අතර, තවත් සමහර සංඛ්‍යා දහස් ගණනින් පෙන්වා නොමැත. එබැවින් ඇතැම් අයදුම්කරුවන් සඳහන් කරන ලද වටිනාකම්වල සාවද්‍යතාවය හේතුවෙන් ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(10) සමහර අයදුම්කරුවන් පොලී ආදායම නිසි ලෙස ගණනය කර නොතිබුණි. එය ආදායමක් වුවද, සමහරු එය මූල්‍ය වියදම් යටතේ සටහන් කර ඇත.

**(b) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) උපචිත ණය පොලී, උපචිත කුලී සහ ආදායම් බදු සඳහා වෙන්කිරීම මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ නිවැරදිව සටහන් කර නොමැත.

(2) ලැබිය යුතු පොලී, කලින් කළ විදුලි වියදම් යනාදිය මුල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ නිවැරදිව සටහන් කර නොමැත.

(3) සමුච්චිත ක්ෂය අගය නිවැරදිව සඳහන් නොකිරීම හේතුවෙන් සමහර අයදුම්කරුවන් අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්හ.

(4) බොහොමයක් අයදුම්කරුවන් ගෙවිය ආදායම් බදු යුතු මුදල නිවැරදිව පෙන්වා නොමැත.

(5) ඇතැම් අයදුම්කරුවන් වත්කම්වලට අදාල ක්ෂයවීම් පෙරවැඩ වල පෙන්වා ඇති නමුත් එම අගයන් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ස්ථානයන්හි සටහන් කර නොතිබුණි.

(6) හිමිකම් නිකුතු ගැලපීම පිළිබඳ දැනුම නොමැතිකම හේතුවෙන් බොහොමයක් අයදුම්කරුවන් ප්‍රකාශිත ප්‍රාග්ධනට අදාල අගය පෙන්වා නොමැත.

(7) බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව රඳවාගත් ඉපැයීම්වලින් පොදු සංචිතයට මාරු කර නොමැත.

(8) බොහොමයක් අයදුම්කරුවන් වෙළඳ ලැබිය යුතු මුදලේ ඉදිරියට ගෙන එන අගයෙන් බොල්ණය ප්‍රතිපාදනය අඩු නොකර ඌණ වෙන් කිරීම පමණක් අඩු කර ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

\- * * * -